කුලිඞ්ගමස් ගුණ. } 378 කුලිඞ්ගො මධුරඃ ස්නිග්ධො වහ්නිශුක්‍රවිවර්ධනඃ
සන්නිපාතහරො වෙශ්මකුලිඞ්ගස්ත්වතිශුක්‍රලඃ

378 කුලිඞ්ගඃ, කුලිඞ්ගමස්; මධුරඃ, මිහිරිවෙයි, ස්නිග්ධඃ, සිනිදුවෙයි; වහ්නිශුක්‍රවිවර්ධනඃ, අග්නිය හා ශුක්‍රවඩයි; සන්නිපාතහරඃ, සන්නිපාතය නසයි; වෙශ්මකුලිඞ්ගස්තු, ගේකුරුළුමස්වනාහී, අතිශුක්‍රලඃ, අතිශයින් ශුක්‍රවඩයි.

තිත්වටු මස්ගුණ. } 379 තිත්තිරිඃ සර්වදොෂඝ්නො ග්‍රාහී වර්ණප්‍රසාදනඃ
මධුරො රොචනො වෘෂ්‍යො මෙධාග්නිබලවර්ධනඃ.

379 තිත්තිරිඃ, තිත්වටුමස්; සර්වදොෂඝ්නඃ, සියලු දොස් නසයි; ග්‍රාහී, මලබද්ධ කෙරෙයි; වර්ණප්‍රසාදනඃ; මාශී ප්‍රසන්න කෙරෙයි; මධුරඃ, මිහිරිවෙයි; රොචනඃ, රුචිකෙරෙයි; වෘෂ්‍යඃ, ධාතුපොෂණය කෙරෙයි; මෙධාග්නිබලවර්ධනඃ, ප්‍රඥාව—අග්නිය—බලය යන මේය වඩින කෙරෙයි.

බුලිතිනි මස්ගුණ. } 380 ශුකමාංසං පරං වෘෂ්‍යං විපාකෙ ගුරු ශීතලම්
කාසශ්වාසක්ෂයහරං සංග්‍රාහි ලඝු දීපනම්.

380 ශුකමාංසං, බුලිතිනිමස්; පරංවෘෂ්‍යං, අතිශයින් ධාතු පොෂණය කෙරෙයි; විපාකෙ, පැසීමෙහි; ගුරු, බරවෙයි; ශීතලම්, සිහිල්වෙයි. කාසශ්වාසක්ෂයහරං, කාසය—ශ්වාසය—ක්ෂයරොගය යන මේ නසාකෙරෙයි; සංග්‍රාහී, මලබද්ධකෙරෙයි; ලඝු, සැහැල්ලුවෙයි; දීපනම්, අග්නිදීපනය කෙරෙයි.

හරියාල නාම් පරෙවිමස් ගුණ } 381 හරියාලොල්පවිට්කඃ සන්ත් කෂායො මධුරොලඝුඃ
රක්තපිත්තප්‍රශමනඃ [illegible]

381 හරියාලඃ, හරියාල නාම් පරෙවිමස්; අල්පවිට්කඃ සන්ත්,

සවලපුවුමල ඇතිවන්නේය; කෂායඃ, කසටවෙයි; මධුරඃ, මිහිරිවෙයි; ලඝුඃ, සැහැල්ලුවෙයි; රක්තපිත්ත ප්‍රශමනඃ, රත්පිත් ශමනයකරෙයි; තෘෂ්ණාඝ්නඃ, පිපාසය නසයි; වාතනාශනඃ, වාතය නසයි.

හංසමස්හා බිජු ගුණ.
382 හංසො වාතහරො වෘෂ්‍යඃ ස්වය්‍යො මාංසබලප්‍රදඃ
හංසාණ්ඩං පරං බල්‍යං වෘංහණං වාතනාශනම්
383 පාකෙ ලඝුතරං ප්‍රොක්තං සර්වාමය විනාශනම්.

382 හංසඃ, හංසමස්; වාතහරඃ, වාතනසයි; වෘෂ්‍යඃ, ධාතුපොෂණය කෙරෙයි; ස්වය්‍යඃ, ස්වරවඩීනය කෙරෙයි; මාංසබලප්‍රදඃ, මාංස හා බලවැඩීම කෙරෙයි; හංසාණ්ඩං, හංස බිජුවටතෙම; පරංබල්‍යං, අතිශයින් බලවැඩීමකෙරෙයි; වෘංහණං, ස්ථූලකෙරෙයි; වාතනාශනම්, වාතනසයි. 383 පාකෙ, පැසීමෙහි; ලඝුතරං, අතිශයින් සැහැල්ලුවෙයි; සර්වාමය විනාශනම්, සියලුරොග නසන්නේයයි; ප්‍රොක්තං, කියනලදී.

සරාලි ආදිපක්ෂි මාංසගුණ.
384 ශරාරිමුද්ගකාදම්බවලාකාඃ පවනාපහාඃ
ස්නිග්ධාඃ ස්වාදුමලාවෘෂ්‍යාරක්තපිත්තහරාහිමාඃ.

384 ශරාරි, කොක්නාමස්ද; මුද්ග, ජලකාවුඩුමස්ද; කාදම්බ, විලිකුකුළුමස්ද; වලාකාඃ, කුඩා කොක්මස්ද යනමොහු; පවනාපහාඃ, වාතය නසන්නාහුය; ස්නිග්ධාඃ, සිනිඳුවෙත්; ස්වාදුමලාඃ, කරණලදමල ඇතිවෙත්; වෘෂ්‍යාඃ, ධාතුපොෂණය කෙරෙත්; රක්තපිත්තහරාඃ, රත්පිත් පහකෙරෙත්; හිමාඃ, ශීතවෙත්.

මුවමස් ගුණ.
හරිණඃ ශීතලො බද්ධවිණ්මූත්‍රො දීපනො ලඝුඃ
385 ගොෂ්ඨාතිසාරපිත්තාසෘඞ්නාශනො රූක්ෂඑවච.

385 හරිණඃ, මුවමස්තෙම, ශීතලඃ, සිහිල්වෙයි; බද්ධවිණ්මූත්‍රඃ, බද්ධවූ මලහා මූත්‍ර ඇතිකෙරෙයි; දීපනඃ, අග්නිදීපනය කෙරෙයි; ලඝුඃ, සැහැල්ලුවෙයි; ගොෂ්ඨාතිසාර, සොළුයහා අතිසාරයද; අසෘක්පිත්ත, රත්පිතද; නාශනඃ, නසයි; රූක්ෂඑවච, රළුදවෙයි.

ඌරුමස්ගුණ—වරාහං පිශිතං වෘෂ්‍යං වාතඝ්නං බලවර්ධනම්.

වරාහං පිශිතං, ඌරුමස්තෙම; වෘෂ්‍යං, ධාතුපොෂණය කෙරෙයි; වාතඝ්නං, වා නසයි; බලවර්ධනම්, බලවඩයි.

386 සමෙෂාංසච ශිරස්කන්ධඃ ප්ලීහගුල්මයකෘද්ගුදම්
පාදපුච්ඡාන්ත්‍රමස්තිෂ්කා මුෂ්කමෙඪ්‍රාඃ සමෙදසාහතාඃ.

387 ධාතවඃ ශොණිතාද්‍යාශ්ච ගුරවඃ ස්‍යුඃ පරස්පරම්.

386 සමෙෂාං, සියලුසත්වයන්ගේ; සිරස්කන්ධඃ, ඉසහා කඳද; ප්ලීහගුල්ම, පිළාවද (උදරයාගේ වම්පාර්ශ්වයෙහිවූ මස්බැල්ල;)

ශකෘත්, අක්මාවද; ගුදං, ගුදයද; පාද, පාදයද; පුච්ඡ, වාලධියද; අන්ත්‍ර, බඩවැලද; මස්තිෂ්ක, හිස්මුල්ද; මුෂ්කකෝෂ, අණ්ඩකෝෂය හා ලයද; සස්නෙහනා:, තෙල්සහිතවූ ද්‍රව්‍යයෝද; 387 ශොණිතාදයඃ, ලේආදිවූ; ධාතවශ්ච, ධාතූහුද; පරස්පරං, ඔවුනොවුන්; ගුරවඃසන්ති, බරවූවාහුවෙත්.

388 වයඃස්ථං නිර්දෝෂං සද්‍යො හතං මාංසං ප්‍රශස්‍යතෙ
මෘතශුෂ්ක ව්‍යාධිතං ශුෂ්කවෘද්ධබාලං විෂෛර්හතම්
389 අගොචරහතං ව්‍යාඩසූදිතං මාංසමුත්සෘජෙත්.

388 වයඃ ස්ථං, තරුණවූ; නිර්දෝෂං, දෝෂනැත්තාවූ; සද්‍යඃ, එකෙණෙහි; හතං, නසනලද්දාවූ; මාංසං, මාංස; ප්‍රශස්‍යතෙ, පසස්නාලැබේ. මෘතංච, (තෙමේම) මළාවූද; ව්‍යාධිතං, රෝගඇත්තාවූද, ශුෂ්ක, ඉව කදමකළද්දාවූද; වෘද්ධබාලං, මහලුවූද ඉතාබාලවූද සිව්පාදීන්ගේද; විෂෛඃ, විසවලින්; හතම්, නසනලද්දාවූද; 389 අගොචරහතං, අප්‍රත්‍යක්ෂව මළාවූද; ව්‍යාඩ, සර්පයන් විසින් හෝ චණ්ඩ මෘගාදීන් විසින්; සූදිතං, ගත්තාලද්දාවූ; මාංසං, මාංස; උත්සෘජෙත්, හරණේය.

මස්යුෂ ගුණ. 390 වසො මාංසස්‍ය චක්ෂුෂ්‍යා වෘංහණී ප්‍රාණවර්ධනී
වෘෂ්‍යා වාතවිකාරඝ්නී සමෘතෞජඃ ස්වරවර්ධනී
භග්නවිෂ්ටම්භී සන්ධීනාං ක්ෂතානාං ව්‍රණිනාං හිතා.

මාංසස්‍ය, මාංසයාගේ; වසඃ, යුෂතෙම; චක්ෂුෂ්‍යා, ඇසට හිතවෙයි; වෘංහණී, ස්ථූලකෙරෙයි; ප්‍රාණවර්ධනී, ජීවිතය වර්ධනකෙරෙයි. 390 වෘෂ්‍යා, ධාතුපොෂණය කෙරෙයි; වාතවිකාරඝ්නී, වාතරෝග නසයි; සමෘති, සිහියද; ඕජඃ, ඕජස්ද; ස්වරවර්ධනී, ස්වරසද යන මෙවඩයි; සන්ධීනාං, සන්ධීන්ගේ; භග්න, බිඳීම; විෂ්ටම්භී, සවිකෙරෙයි; ක්ෂතානාං, ක්ෂතවූවන්ටද; ව්‍රණිනාං, වණඇත්තාවූන්ටද; හිතා, හිත වෙයි.

ගිතෙලින් පිසූමස්ගුණ. 391 මාංසන්තු ඝෘතසංසිද්ධං පුෂ්ටිදං පිත්තනුල්ලඝු
ප්‍රීණනං සර්වධාතූනාං විශෙෂාන්මුඛශොෂිණාම්.

391 ඝෘතසංසිද්ධං, ගිතෙලින් සිද්ධකරණලද්දාවූ; මාංසන්තු, මස්ව නාහි; පුෂ්ටිදං, පුෂ්ටිකෙරෙයි; පිත්තනුත්, පිත්තනසයි; ලඝු, සැහැල්ලුවෙයි; සර්වධාතූනාං, සියලුධාතූන්ගේ; ප්‍රීණනං, පිණවීම කෙරෙයි; විශෙෂාත්, විශෙෂයෙන් මුඛශොෂිණාම්, මුඛය වියලෙන්නාවූන්ට; (හිතවෙයි.)

තලතෙලින් බැදිමස්ගුණ. 392 මාංසං සතෛලසංසිද්ධං වීර්‍යොෂ්ණං පිත්තලං
අග්නිසන්දීපනං රුච්‍යං දෘෂ්ටිනුත් දාර්ඪ්‍යකෘත්ගුරු.

392 සතෛලසංසිද්ධං, තලතෙලින් සිද්ධකරණලද්දාවූ; යත්මාංසං, යම් මාංසයෙක් ඇද්ද; (එතෙම) වීර්‍යොෂ්ණං, උෂ්ණවීර්‍යවෙයි;

පිත්තලං, පිත්තවඩයි; කටු, කටුරසවෙයි; අග්නිසන්දීපනං, අග්නිදිප්තිය කෙරෙයි; රුච්‍යං, රුචිකෙරෙයි; දාහපිත්තනුත්, දාහපිත්තහරයි; පුෂ්ටිකෘත් පුෂ්ටිකෙරෙයි; ගුරු, බරවෙයි.

ලොහලලෙන්ඇති පිලිස්සුමස්ගුණ. 393 මාංසනාශු ශූලිකං ලෞහකානම්බඟාරපරිපාචිතම් මෙද්‍යං ගුරුතරං වෘෂ්‍යං දීප්තාග්නීනාං සදාහිතම්.

393 අඟාරපරිපාචිතම්, අඟුරෙහිපිසනලද්දවූ; ශූලිකං, උලෙලහිවූ; මාංසනාශු, මස්වනාහි; ගුරුතරං, අතිශයින් බරයයි; මෙද්‍යං, මේදයුතු; වෘෂ්‍යං, ධාතුපොෂණය කෙරෙයි; දීප්තාග්නීනාං, අග්නිදීප්තිය ඇත්තවුන්ට; සදා, හැමකල්හි; හිතම්, හිතයයි; ලෞහකානම්, කීයනලදී.

ඉති මාංස වර්ගඃ.

මද්‍ය ගුණ 394 ප්‍රකෘත්‍යා මද්‍යමත්‍යුෂ්ණමම්ලංචොෂ්ණං විපාකතඃ
රසං සාමාන්‍යතස්තස්‍ය විශෙෂඋපදෙශ්‍යතෙ.

395 ශාකානාං රක්තමූත්‍රාණාං ග්‍රහණ්‍යර්ශෝවිකාරිණාම්
සුරා ප්‍රශස්තා වාතඝ්නී ස්තන්‍යරක්තක්ෂයෙෂුච

396 ප්‍රසන්නා ගුල්මවාතාර්ශෝ විබන්ධානාහනාශනී
ශූලප්‍රවාහිකාටොපකඵවාතාර්ශසාං හිතා.

397 ජගලො ග්‍රාහී රූක්ෂොෂ්ණශොථඝ්නො භක්තපාචනඃ
කඵාර්ශෝ ග්‍රහණීදොෂාන් හන්ති වාතකඵාමයාන්.

398 ප්‍රායශොභිනවං මද්‍යං ගුරුදොෂසමීරිතම්
ශ්‍රොතසාං ශොධනං ජීර්ණං දීපනං ලඝු රොචනම්.

399 හර්ෂණං ප්‍රීණනංබල්‍යං මද්‍යං ශොකශ්‍රමාපහම්.
ප්‍රාගල්භ්‍යප්‍රතිභාවීර්‍ය්‍යතුෂ්ටිපුෂ්ටිස්වරප්‍රදම්.

394 මද්‍යං, මද්‍යසතෙම; ප්‍රකෘත්‍යා, ප්‍රකෘතියෙන්; අත්‍යුෂ්ණං, ඉතාඋෂ්ණවෙයි; විපාකතඃ, පැසීමෙන්; අම්ලංරසං, ඇඹුල්රසවෙයි; උෂ්ණඤ්ච, උෂ්ණදවෙයි; සාමාන්‍යතඃ, (මේ)සාමාන්‍යසෙන් ගුණවේ; තස්‍ය, ඒමද්‍යයාගේ; විශෙෂඃ, විශෙෂයතෙම; උපදෙශ්‍යතෙ, දක්වනුලැබේ; **395** ශාකානාං, ශාකගුල්මවන්ටද; රක්තමූත්‍රාණාං, රක්තමූත්‍රඇත්තවුන්ටද; ග්‍රහණ්‍යර්ශෝවිකාරිණාං, ග්‍රහණීසහ අර්ශස්රොග ඇත්තවුන්ටද; සුරා, සුරාතොමෝ; ප්‍රශස්තා, ප්‍රශස්තවන්නීය; වාතඝ්නී, වාතනසන්නීය; ස්තන්‍යරක්ත ක්ෂයෙෂුච, තනකිරිහිනා; ලේ ක්ෂයවූවන් කෙරෙහිද (ප්‍රශස්ත වන්නීය.) **396** ප්‍රසන්නා, ප්‍රසන්නානම්; සුරාතොමෝ; ගුල්ම, ගුල්මය ද; වාතාර්ශෝ, වාතය හා අර්ශස්ද; විබන්ධ, මලමූත්‍රබද්ධයද; ආනාහ, බඩ පිපුමද; නාශනී, නසන්නීය; ශූල, රුජාවද; ප්‍රවාහිකා, ප්‍රවාහිකාවද; ආටොප, මලවඩියද; කඵ, සෙම්ද; වාත, වාතයද; අර්ශසාං, අර්ශස

ඝනමොඩුන්ට; ගිහා, ගිනවන්නීය; **397** ජගනඃ, ජඝනාමිසුරාතෙම; ග්‍රාහි, මලබඩිගෙහෙරයි; රූක්ෂොෂ්ණ, රළුහා උෂ්ණවෙයි; ශොථඝඃ, ඉදිමිමනසයි; භක්තපාචනා, ආහාර පැසවයි; කඵාශී, සෙම් අශිස්ද; ග්‍රහණීදෝෂාන්, ග්‍රහණීදොෂයන්ද; වාතකඵාමයාන්, වාතසෙම්රොගයන්ද; හන්ති, නසා; **398** අභිනවංමද්‍යං, අළුත්මුසුරා; ද්‍රායශඃ, බොහෝ සෙයින්; ගුරු, බරවෙයි; දෞෂලං, දොෂවඩන්නේයයි; ජිරණං, හියහාලදී; ජීර්ණං, පුරානහාසුරා; ස්‍රොතසාං, රසවහනය වන්නාවූ ස්‍රොතසුන්ගේ; ශොධනං, ශුඬකෙරෙයි; දීපනං, අග්නිදීපනය කෙරෙයි; ලඝු, සැහැල්ලුවෙයි; රොචනං, රුචිකෙරෙයි; **399** හර්ෂණං, සතුටුකෙරෙයි; ප්‍රීණනං, පිණවයි; බල්‍ය, බලවඩයි; මද්‍යං, මත්කෙරෙයි; ශොකශ්‍රමඅපහං, ශොකයහා විඩාපහකෙරෙයි; ප්‍රාගල්භ්‍ය, කපටිභාවයහෝ වාචාලබවද; ප්‍රතිභා, ශරීරදීප්තියද; විශ්‍ය, ශක්තියද; තුෂ්ටි, සන්තොෂයද; පුෂ්ටි, ශරීරපුෂ්ටියද; සවරප්‍රදං, සවරයද දෙයි.

සැරයවිද්දරීමෙ ගුණ.
400 සබලතඃ සංප්‍රතිෂ්ඨානං ශත්‍රූණාංච නිවාරණම්
අවෂ්ටම්භනමායුෂ්‍යං භයඝ්නං දණ්ඩධාරණම්.

400 දණ්ඩධාරණම්, සැරයවිද්දරීම; සබලතඃ, පැකිලෙන්නාහට; සංප්‍රතිෂ්ඨානං, ආධාරවෙයි; ශත්‍රූණාංච, සතුරන්ගේද; නිවාරණං, වැලැක්වීම කෙරෙයි; අවෂ්ටම්භනම්, එල්බීමකෙරෙයි; ආයුෂ්‍යං, ආයුෂට හිතවෙයි; භයඝ්නං, භයනසයි.

යවිගුණ
401 යවඃ කෂායො මධුරො බහුවාතශකෘද්ගුරුඃ
රූක්ෂඃ ස්ථෛර්‍ය්‍යකරඃ ශීතො මූත්‍රමෙදඃ කඵාපහඃ.

401 යවඃ, යවවීතෙම; කෂායඃ, කසටවෙයි; මධුරඃ, මිහිරිවෙයි; බහුවාතශකෘත්, බොහොවූ වාතයහා මලඇතිකෙරෙයි; ගුරුඃ, බරවෙයි; රූක්ෂඃ, රළුවෙයි; ස්ථෛර්‍ය්‍යකරඃ, ස්ථිරභාවය කෙරෙයි; ශීතඃ, ශීතවෙයි; මූත්‍රමෙදඃ, මූත්‍රදොෂහා මෙදස්ද; කඵාපහඃ, සෙම්ද පහකෙරෙයි.

යවඅන්සුණු ගුණ.
402 යවානාං ශක්තවො රූක්ෂා ලඝනා වහ්නිවර්ධනාඃ
වාතලාඃ කඵපිත්තඝ්නා වාතවර්චො'නුලොමනාඃ.
403 ගුර්වී පිණ්ඩීකෘතානාත්‍යර්ථං ලඝ්වී සොවර්ප වයසීයා.

402 යවානාං, යවයන්ගේ; ශක්තවඃ, අන්සුණුතුමූ; රූක්ෂාඃ, රළුවෙත්; ලඝනාඃ, පැසීමෙහි බරනොවූත් අඩිකමාංසයන් නැතිකෙරෙත්; වහ්නිවර්ධනාඃ, අග්නියවඩත්; වාතලාඃ, වාතබහුලවෙත්; කඵපිත්තඝ්නාඃ, සෙම් පිත්නසත්; වාතවර්චඃ, වාතයහා මල; අනුලොමනාඃ, අනුලොම් කෙරෙත්; **403** පිණ්ඩීකෘතා, පිඩුකරණ ලද්දවූ අන්සුණුතෙමෝ; අත්‍යර්ථං, අභිශයින්; ගුර්වී, බරවන්නීය; සාවඅපි, ඒඅන්සුණුම; වයසීයා, දියකිරීමෙන්, ලඝ්වී, සැහැල්ලුවන්නීය.

යවඅස්සුණු තලප ගුණ. 404 ශතපුෂ්පාමාශු ජීර්යෙත්‍ත මෘදුත්වාදවලෙහිකා
යවමණ්ඩඃ ප්‍රශංසන්ති ශූලෙ ත්‍රිදෝෂසම්භවෙ.

404 ශතපුෂ්පාම්, අස්සුණුහුගේ; අවලෙහිකා, තලපතොමෝ; මෘදුත්වාත්, මෘදුබැවින්; ආශුජීර්යෙත, වහාදිරන්නේය; යවමණ්ඩඃ, යවමණ්ඩයතෙම; ත්‍රිදෝෂසම්භවෙ, තුන්දොසින්උපන්; ශූලෙ, රුජාවෙහි; ප්‍රශංසන්ති, ප්‍රශස්තාවෙත්.

බැදියවතලපගුණ. 405 වාට්‍යමණ්ඩො විබන්ධඝ්නඃ ශූලනාහවිනාශනඃ
පාචනො දීපනො හෘද්‍යඃ පිත්තශ්ලෙෂ්මානිලාපහඃ.

405 වාට්‍යමණ්ඩඃ, බැදියවතලපතෙම; විබන්ධඝ්නඃ, මලමූත්‍රබද්ධ නසයි; ශූල, රුජාවද; ආනාහ, බඩපිපුම්ද; විනාශනඃ, නසයි; පාචනඃ, පැසවීම කෙරෙයි; දීපනඃ, අග්නිදීප්තිය කෙරෙයි; හෘද්‍යඃ, මනොඥවෙයි; පිත්තශ්ලෙෂ්මානිලාපහඃ, පිත්තය-සෙම්ය-වාතය සන්සිඳුවන කෙරේ.

යවගොධූමමාෂාශ්ච තිලාශ්චාභිනවා හිතාඃ
406 පුරාණා විරසා රූක්ෂා න ච ස්වාදුකරා මතාඃ.

406 අභිනවාඃ, අලුත්වූ; යව, යවද; ගොධූම, තිරිඟුද; මාෂාශ්ච, මෑ යනමෙහුද; තිලාඃච, තලද; හිතාඃ, හිතවෙත්; පුරාණාඃ, පරණවූවාහු; විරසාඃ, රසනැතිවෙත්; රූක්ෂාඃ, රළුවෙත්; නචස්වාදුකරාඃ, මිහිරි නොවන්නාහුයයි; මතාඃ, දන්නාලද්දාහුය.

යවකර ගුණ 407 යවක්ෂාරො හරෙදර්ශඃ ශ්වාසාන් වාතකඵාමයාන්
තස්මාදල්පාන්තරගුණඃ සර්ජිකාක්ෂාර උච්‍යතෙ.

407 යවක්ෂාරඃ, යවකර ලුණුතෙම; අර්ශඃ, අර්ශසද; ශ්වාසාන්, ශ්වාසයන්ද; වාතකඵාමයාන්, වා සෙම්රොග (ගුල්මය-ලෙහිරොගය-ග්‍රහණිය-පාණ්ඩුරොගය-පිලාය-මලමූත්‍රබද්ධය-කණ්ඨරොගය) ආනාමෝවූන්; හරෙත්, පහකරන්නේය; සර්ජිකාක්ෂාරඃ, සුවස ලුණුතෙම; තස්මාත්, ඒ යවකාරවලටවඩා; අල්පාන්තරගුණඃ, මඳක් ගුණහීනයයි; උච්‍යතෙ, කියනුලැබේ.

අදිමොදගම්ගුණ. 408 යමානී කුෂ්ඨශූලඝ්නී හෘද්‍යා පිත්තාග්නිකාරිණී
සමීරණබලාසඝ්නී ක්‍රිමීනාඤ්ච විනාශනී.

408 යමානී, අදිමොදගම්තොමෝ; කුෂ්ඨශූලඝ්නී, කුෂ්ඨය රුජා නසන්නීය; හෘද්‍යා, හෘදයට ප්‍රියවන්නීය; පිත්තාග්නිකාරිණී; පිත්තය අග්නියවඩන්නීය; සමීරණබලාසඝ්නී, වා සෙම් නසන්නීය; ක්‍රිමීනාඤ්ච, ක්‍රිමීන්ගේ; විනාශනී, නැසීමකරන්නීය.

වැල්මීගුණ—මධුකං රක්තපිත්තඝ්නං ව්‍රණශොධන රෝපණම්.

මධුකං, වැල්මීතෙම; රක්තපිත්තඝ්නං, රත්පිත්තනසයි; ව්‍රණශොධ නරෝපණං, වණසුඩියහා රෝපණය කෙරෙයි.

රුවන්අබරණ දැරීම ගුණ. — 409 ධන්‍යං යශස්‍යමායුෂ්‍යං ශ්‍රීමද්ව්‍යසනසූදනම්
හර්ෂණං කාම්‍යමොජස්‍යං රත්නාභරණධාරණම්

409 රත්නාභරණධාරණං, රන්ආභරණදැරීම; ධන්‍යං, භාග්‍යවෙයි; යශස්‍යං, කීර්ති ඇතිකෙරෙයි; ආයුෂ්‍යං, ආයුවඩයි; ශ්‍රීමත්, ශරීර ශොභා ඇතිකෙරෙයි; ව්‍යසනසූදනම්, විපත්තිනසයි; හර්ෂණං, ප්‍රීති උපදවයි; කාම්‍යං, කාමයට හිතවෙයි; ඕජස්‍යං, ඕජවඩයි.

අව්ගුණ. — 410 ආතපඃ කටුකො රූක්ෂඃ ස්වේදමූර්ඡාතෘෂාවහඃ
දාහවෛවර්ණ්‍යජනනො නෙත්‍රරොගප්‍රකොපණඃ.

410 ආතපඃ, අව්වතෙම; කටුකඃ, කටුකවෙයි; රූක්ෂඃ, රළුවෙයි; ස්වෙදමූර්ඡාතෘෂාවහඃ, ඩහදිය–මූර්ඡා–පිපාසය යනමේ එලවයි; දාහ වෛවර්ණ්‍යජනනඃ, දාහයහා ශරීරයාගේ විවර්ණභාවය කෙරෙයි; නෙත්‍රරොගප්‍රකොපණඃ, නෙත්‍රරොගකිපීම කෙරෙයි.

රෑ නිදිමැරීම හා දවල් නින්දගුණ. — 411 රාත්‍රෞ ජාගරණං රූක්ෂං ස්නිග්ධං ප්‍රස්වපනං දිවා.

411 රාත්‍රෞ, රාත්‍රියෙහි; ජාගරණං, නිද්‍රාවර්ජිතකිරීම තෙම; රූක්ෂං, (ශරීරය) රළුකෙරෙයි; දිවා, දවල්; ප්‍රස්වපනං, අතිශයින් නිදීමතෙම; ස්නිග්ධං, (ශරීරය) සුනිදුකෙරෙයි.

ව්‍යක්තිභෙද යෙන් රෑනිදිමැරීමහා දවල් නින්දගුණ. — 412 කඵමෙදොවිෂාර්තානාං රාත්‍රෞ ජාගරණං හිතම්
දිවාස්වපනශච තෘඩ්ශූලහික්කාජීර්ණාතිසාරිණාම්.

412 කඵමෙදොවිෂාර්තානාං, සෙමය–මෙදස්රොගය–විෂය යන මෙයින් පීඩිතවූවන්ට; රාත්‍රෞ, රාත්‍රියෙහි; ජාගරණං, නිදිවර්ජිතකි රීමද; තෘට්, පිපාසය; ශූල, ශූලය; හික්කා, හික්කාවය; අජීර්ණ, අජී ර්ණය; අතිසාරිණාම්, අතීසාරය යනමේරොග ඇත්තවුන්ට; දිවාස්ව පනංච, දවල් නිදීමද; හිතම්, හිතවේ.

ඇත්මදුඅලආදි අලජාතිගුණ. — හස්තිමධ්වාලුකාදීනි රක්තපිත්තහරාණි ච
413 ගුරූණි ස්වාදුශීතානි ස්තන්‍යශුක්‍රකරාණි ච.

413 හස්තිමධ්වාලුකාදීනි, ඇත්මදුආදි අලජාතිහුතුමු; රක්තපිත්ත හරාණිච, රත්පිත්නසත්; ගුරූණි, බරවෙත්; ස්වාදුශීතානි, මධුරරස හා ශීතලවෙත්; ස්තන්‍යශුක්‍රකරාණිච, තනකිරිහා ශුක්‍රදවඩත්.

කෙසෙල් ගුණ.

කදලං මධුරං වෘෂ්‍යං කෂායං නාතිශීතලම්
414 රක්තපිත්තහරං හෘද්‍යං රුච්‍යං ශ්ලේෂ්මකරං ගුරු,
තද්වච්ච පක්වකාබ්‍යතනු වාතරක්තහරං පරම්
415 වෘෂ්‍යමෞෂධමභිශීතලඤ්ච මධුරං රසපාකයොඃ.

කදලං, කෙසෙල්; මධුරං, මිහිරිවෙයි; වෘෂ්‍යං, ධාතුපොෂණය කෙරෙයි; කෂායං, කසටවෙයි; අනිතිශීතලංහ, අතිශයින් සීත්නොව වයි; 414 රක්තපිත්තහරං, රත්පිත පහකෙරෙයි; හෘද්‍යං, හෘදයටප්‍රිය වෙයි; රුච්‍යං, රුචිකෙරෙයි; ශ්ලේෂ්මකරං, සෙම්වඩයි, ගුරු, බරවෙයි; පක්වකාබ්‍යතනු, පක්වකායන නම්ඇත්තාවූ; තත්එව, ඒ කෙසෙල්ම; වාතරක්ත හරං, වාතරක්තය නසයි; පරම්, උතුම්වෙයි; 415 වෘෂ්‍යං චඑව, ධාතුපුෂ්ටියකෙරේමය; අභිශීතංච, ඉතාශීතලද්වෙයි; රසපාක යොඃ, රසයපැසුනුකල්හි; මධුරං, මධුරවෙයි.

රහනමල්හා මුසලමල්ගුණ. රාඞගණං රක්තපිත්තඝ්නං මුච්කුන්දං ශිරොර්තිජිත්

රාඞගණං, රහණමල්තෙම; රක්තපිත්තඝ්නං, රත්පිතනසයි; මුචු කුන්දං, මුසලමල්තෙම; ශිරොර්තිජිත්, හිසෙහිවූ පීඩානසයි.

ලූනුනුගුණ. 416 ලශුනඃ ක්ෂාරමධුරඃ කටුකෝෂ්ණො වෘෂ්‍යො ගුරුඃ සරඃ
භග්නසන්ධානකෘච්චබල්‍යො රක්තපිත්තප්‍රකොපණඃ.

416 ලශුනඃ, ලූනුනුතෙම; ක්ෂාරමධුරඃ, ලුණුරසහා මධුරවෙයි; කටුකඃ, සවරළඹිනයකෙරෙයි; වෘෂ්‍යඃ, ධාතුපොෂණය කෙරෙයි; ගුරුඃ, බරවෙයි; සරඃ, සාරවෙයි; භග්නසන්ධානකෘත්, ඇටආදි බිඳීම ගේ ගැලපීම්කෙරෙයි; බල්‍යඃ, බලවඩයි; රක්තපිත්ත ප්‍රකොපණඃ, රත්පිත් කොපකෙරෙයි.

රත්සඳුන්ගුණහා මහ ගොන්කැකිරි ගුණ. 417 රක්තපිත්තහරං බල්‍යං චක්ෂුෂ්‍යං රක්තචන්දනම්
විශාලා කඵපිත්තඝ්නී චක්ෂුෂ්‍යා මූත්‍රකෘච්ඡ්‍රජිත්.

417 රක්තචන්දනම්, රත්සඳුන්තෙම; රක්තපිත්තහරං, රත්පිත් නසයි; බල්‍යං, බලවඩයි; චක්ෂුෂ්‍යං, ඇසට හිතවෙයි; විශාලා, මහ ගොන්කැකිරිතොමෝ; කඵපිත්තඝ්නී, සෙම්පිත් නසන්නීය; චක්ෂුෂ්‍යා, ඇසටහිතවන්නීය; මූත්‍රකෘච්ඡ්‍රජිත්, මූත්‍රකෘච්ඡ්‍රාව ජයගනී.

වටරුගැන අරන්න දෙකහා බැම්හිරිය ගුණ. 418 රේණුකා කඵවාතඝ්නී දීපනී පිත්තකාලංඝුඃ
රාස්නා යොජාමවාතඝ්නී ප්‍රායනාති කඵපිත්තනුත්.

418 රේණුකා, වටරුකැනතොමෝ; කඵවාතඝ්නී, සෙම්වා නසන් නීය; දීපනී, අග්නිදීපනය කරන්නීය; පිත්තකෘත්, පිත්වඩන්නීය;

ලඝු, සැහැල්ලුවන්නීය; රාසනා, අරත්තතොමෝ; ශොථාම ඝාත ඝ්නී, ඉදිමුම්හා ආමවාතය නසන්නීය; ප්‍රායශඃ, බැමිනිරිසතොමෝ; කඵපිත්තඝ්නුන්, සෙම්පිත් නසන්නීය.

ලබුගුණ. { 419 අලාබූ භේදිනී ගුර්වී පිත්තඝ්නී කඵදා හිමා
පාණ්ඩුරෝගක්‍රිමිශ්ලෙෂ්මවිෂනාශිත්තිකාතතොලඝුඃ.

419 අලාබූ, ලබුතොමෝ; භෙදිනී, මලබිඳීමකරන්නීය; ගුර්වී, බර වන්නීය; පිත්තඝ්නී, පිත්තනසන්නීය; කඵදා, සෙම්වඩන්නීය; හිමා, ශීතවන්නීය; පාණ්ඩුරෝග, පාණ්ඩුරෝගය; ක්‍රිමි, ක්‍රිමීන්ය; ශ්ලෙෂ්ම, සෙමය: විෂනාශිනී, පිතද යන මෙය ජයගණී; තිකතා, තිකතවෙයි; ලඝුඃ, සැහැල්ලුවෙයි.

වැල්කස්තුරිහා කරාබුගුණ. { 420 ලතාකස්තුරිකා හෘද්‍යා ශීතාතිකතාස්‍යරෝගනුත්
ආධ්මානානාහශූලඝ්නං ලවඞ්ගං දීපනංලඝු.(ත්

420 කස්තුරිකාලතා, වැල්කස්තුරිතොමෝ; හෘද්‍යා, මුඛසාට්‍රියවන් නීය; ශීතා, ශීතවන්නීය; තිකතා, තිකතවන්නීය; ආස්‍යරෝගනුත්, මුඛරෝග නසන්නීය; ලවඞ්ගං, කරාබුනෙම; ආධ්මාන, ආනාහශූල ඝ්නං, බඩපිපීමය—මලබද්ධය-රුජාය යනමෙය නසයි; දීපනං අග්නි දීප්තියකෙරෙයි; ලඝු, සැහැල්ලුවෙයි.

ලොත් හා ලාකඩගුණ. { 421 ලොධ්‍රොමලකඵපිත්තඝ්නස්තාගචක්ෂුෂ්‍යඃශොථජිත්සරඃ
ලාක්ෂාභග්නවිසර්පඝ්නී වල්‍යා ත්වග්දොෂනාශිනී.

421 ලොධ්‍රඃ, ලොත්තෙම; අම්ලකඵපිත්තඝ්නඃ, ඇඹුල් සෙම්පිත් නසයි; චක්ෂුෂ්‍යඃ, ඇසට හිතවෙයි; ශොථජිත්, ඉදිමුම්; නසයි; සරඃ, සාරවෙයි; ලාක්ෂා, ලාකඩතොමෝ; භග්නවිසර්පඝ්නී, බිඳීම හා, හෙඩි නසන්නීය; වල්‍යා, බලවඩන්නීය; ත්වග්දොෂනාශිනී, ත්වගතදොෂ නසන්නීය.

ලුණුරස ගුණ. { 422 ලවණඃ ක්ලෙදනාත්‍යන්තීක්ෂණඃ පාචනො දීපනඃ සරඃ
ස්නිග්ධො රුචිකරඃ ස්‍යන්දී දෘෂ්ටිගුරුහරො ලඝුඃ.

422 ලවණඃ, ලුණුතෙම; ක්ලෙදනඃ, තෙත්හෝ ගිලන්කෙරෙයි; තීක්ෂණ, තියුණුවෙයි; පාචනඃ, පැසවීමකෙරෙයි; දීපනඃ, අග්නිදීප්ති යකෙරෙයි; සරඃ, සාරවෙයි; ස්නිග්ධඃ, සිනිඳුවෙයි; රුචිකරඃ, රුචිකෙ රෙයි; ස්‍යන්දී, වැගිරීමහෝ වම්හකරයි; දෘෂ්ටිගුරුහරඃ, දෘෂ්ටියහාබර ය යනමෙයනසයි හෙවත් ශුක්‍රබලය නසයි; ලඝුඃ, සැහැල්ලුවෙයි.

තල්වැටප වන ගුණ. { 423 තාලවෘන්තමසෞ වාතශ්ලෙෂ්මශමනො ලඝුඃ
වංශව්‍යජනජෝ වාතො රූක්ෂශොෂාවාතපිත්තදඃ
424 වස්ත්‍රව්‍යජනමොජස්‍යං මක්ෂිකාදීන් ව්‍යපොහති
මායූරා ව්‍යජනද්‍රමෙත්‍රා වාතා දොෂත්‍රයාපහාඃ.

423 තාලවෘන්තාමියඃ, තල්වැටමයඹු; වාතඃ, වාතයතෙම; ත්‍රිදෝෂ ශමනඃ, තුන්දොස් ශමනකෙරෙයි; ලඝුඃ, සැහැල්ලුවෙයි; වංශවීජ තාජඃ, උණහා බටගසතල්වැටින්වූ, වාතඃ; වාතයතෙම, රූක්ෂණඃ, රළුහා රූක්ෂණවෙයි; වාතපිත්තදඃ, වාපිත්වඩයි; **424** ව්‍යානවෘජ නම්, චාමරයෙන්වූ පවන්තෙම; ඕජස්‍යං, ඕජාවඩයි; මක්ෂිකාදීන්, මැසිමදුරුආදීන්; ව්‍යපෝහති, දුරුකෙරේ; මායූරාඃ, මොනරවිලින් උපන්නාවූද; වස්ත්‍රාඃ, වස්ත්‍රමයතල්වැටින් දුන්නාවූද; වෛත්‍රාඃ, සම්වස්ත්‍රයෙන් උපන්නාවූද; වාතාඃ, වාතයෝ; දෝෂත්‍රයඅපහාඃ, තුන්දොස් පහකෙරෙත්.

ව්‍යඤ්ජන ගුණම්.

පතෝල සමග පිසූමාංසගුණ. — 425 පටොලඵලසංසිද්ධං මාංසං පිත්තකඵාපහං
හෘද්‍යං රුච්‍යාග්නිකෘත්තෘෂ්ණා ජ්වරමේහවිසර්පනුත්.

425 පටොලඵලසංසිද්ධඃ, පතෝල හා සමග පිසූකරණලද්දාවූ; මාංසඃ, මස්; පිත්තකඵාපහඃ, පිත් සෙම් පහකෙරෙයි; හෘද්‍යඃ, මනොඥවෙයි හෙවත් මුඛයට ප්‍රියවෙයි; රුච්‍යාග්නිකෘත්, රුචිය හා අග්නියකෙරෙයි; තෘෂ්ණා, පිපාසයද; ජ්වර, උණද; මෙහ, ප්‍රමෙහයද; විසර්පනුත්, ගෙඩිද යන මෙය නසයි.

එළබටු සමග පිසූමාංසගුණ — 426 මාංසං වාර්තාකිසංසිද්ධං පථ්‍යං පිත්තකඵාපහං
අග්නිසංදීපනකරං රොචනං ශොථනාශනං.

426 වාර්තාකිසංසිද්ධඃ, එළබටුහා මනාව යොදනලද්දාවූ; මාංසඃ, මස්; පථ්‍යඃ, හිතවෙයි, පිත්තකඵාපහඃ, පිත් සෙම් පහකෙරෙයි; අග්නිසංදීපනකරඃ, අග්නිදීප්තිය කෙරෙයි; රොචනඃ, රුචිකෙරෙයි; ශොථනාශනඃ, ඉදිමුම නසයි.

පතෝල කොළසමග පිසූ මස් ගුණ. — 427 මාංසං පටොලපත්‍රෙණ සිද්ධං ජීර්ණජ්වරාපහං
විබද්ධවාතශ්ලෙෂ්මඝ්නං රොචනං පථ්‍ය උත්තමං.

427 පටොලපත්‍රෙණ, පතෝලපත්‍රහා; සිද්ධඃ, සිද්ධකරණලද්දාවූ; මාංසඃ, මස්; ජීර්ණජ්වරඅපහඃ, පුරාණජ්වරය පහකෙරේ; විබද්ධ වාතශ්ලෙෂ්මඝ්නඃ, මලබද්ධය-වාතය-සෙමය යන මෙය නසයි; රොචනඃ, රුචිකෙරෙයි; පථ්‍යඃ, හිතවෙයි; උත්තමඃ, උතුම්වෙයි.

මුලපලා සමග පිසූමාංසගාණි තිවැල් සමග පිසූමාංසගුණ. — 428 ශිලමොචිමත්ස්‍යඝ්ණො සඝ්නාතඃ කඵපිත්තනුත්
කාලම්බීඝටිතො මාංසඃ සංශොෂ්‍ය දෙෂලො (ගුරුඃ

428 ශිලමොචිමත්ස්‍යඝ්ණො, මූලපලාහා මසුන්ගෙන් යුක්තකරණ ලද ව්‍යඤ්ජනයතෙම; සනිකානඃ, නිත්‍යාසනිනවෙයි; කඵපිත්තනුත්,

සෙම්පිත්නසයි; කලම්බීෂපිතඃ, නීතිවැල්හා යොදනලද්දවූ; මත්ස්‍යඃ, මස්; සංවෘෂ්‍යඃ, ධාතුපුෂ්ටිකෙරෙයි; දෝෂලඃ, දෝෂයන්ගෙන් යුක්ත වෙයි; ගුරුඃ, බරවෙයි.

ඉකිරිකො ළ සමග පිසූ මාංස ගුණ. } 429 කොකිලාක්ෂදලෛඃ සිද්ධඃ කාමලාජ්වරශොථජිත්
වහ්නිසංදීපනො රුච්‍යො ජීර්ණජ්වරහරො ලඝුඃ.

429 කොකිලාක්ෂදලෛඃ, ඉකිරිපත්හා; සිද්ධඃ, සිද්ධකරණලද්දවූ (මස්;) කාමලාජ්වරශොථජිත්, කාමලා-උණ-ඉදිමුමයනමෙය නසයි; වහ්නිසංදීපනඃ, අග්නිදීප්තියකෙරෙයි; රුච්‍යඃ, රුචිකෙරෙයි; ජීර්ණජ්වරහරඃ, පුරාණජ්වරයපහකෙරේ; ලඝුඃ, සැහැල්ලුවෙයි.

වැල්නීතිසමග පිසූමාංස ගුණ. } 430 ග්‍රීෂ්මසුන්දරකෛඃ සිද්ධො රුච්‍යඃ පිත්තකඵාපහඃ.

430 ග්‍රීෂ්මසුන්දරකෛඃ, වැල්නීතිහා සමග සිද්ධඃ, සිද්ධකරණලද්දවූ මස්; රුච්‍යඃ, රුචිකෙරෙයි; පිත්තකඵාපහඃ, පිත්සෙම් පහකෙරෙයි.

ඇඹුලැඹිලියසමගපිසූමාංසගුණ. } 431 චාඞ්ගෙරීපත්‍රසංසිද්ධඃ කඵවාතාමගුල්මනුත්
සංග්‍රාහිදීපනොහෘද්‍යො රුච්‍යොවාතානුලොමනඃ.

431 චාඞ්ගෙරීපත්‍රසංසිද්ධඃ, ඇඹුලැඹිලිය පත්‍රහා යොදනලද්දවූ (මස්;) කඵවාතාම ගුල්මනුත්, සෙම්ය-වාතය-ආමරුජාය යනමෙය නසයි; සංග්‍රාහි, මලබැඳීම කෙරෙයි; දීපනඃ, අග්නිදීප්තිය කෙරෙයි; හෘද්‍යඃ, මනොඥවෙයි; රුච්‍යඃ, රුචිකෙරෙයි; වාතඅනුලොමනඃ,වාතය අනුලොම්කෙරෙයි.

ඉදුනුකොමඩු පුසුල් සමග පිසූ මාංස ගුණ. } 432 කූෂ්මාණ්ඩෛඃ පාචිතඃ පක්වොමත්ස්‍යො ධාතුවිවර්ධනඃ
රක්තපිත්තහරඃ කුෂ්ඨමෙහක්‍රිමිවිනාශනඃ.

432 පක්වඃ, පැසුනාවූ; කූෂ්මාණ්ඩෛඃ, කොමඩු පුසුල්හා; පාචිතඃ, පිසනලද්දවූ; මත්ස්‍යඃ, මස්; ධාතුවිවර්ධනඃ, ධාතුවඩයි; රක්තපිත්තහරඃ, රත්පිත්පහකෙරෙයි; කුෂ්ඨ, කුෂ්ඨය; මෙහ, ප්‍රමෙහය; ක්‍රිමිවිනාශනඃ, පණුවරොගය යන මෙය නසයි.

ලබුසමගපිසූ මාංසගුණ. } 433 ලාවුකෙකශවිඩඞ්ගඩාසිද්ධා මධුරී පරිකීර්තිතා
මූත්‍රලා භින්නවිට්කාච ගුර්වී රුච්‍යා කඵාවහා.

433 ලාවුකෙ, ලබුහා; විඩඞ්ගඩාසිද්ධා, විඩඞ්ගයන මත්ස්‍යයන්ගෙන් යුක්තව සිද්ධකරණලද්දවූ ව්‍යඤ්ජනයතොමෝ; මධුරී, මිහිරිවත්නිය; මූත්‍රලා, මූත්‍රවඩන්නිය; භින්නවිට්කාච, මලබිඳීම කරන්නිය;

ගුණි, බරවන්නිය; රුච්‍යා, රුචිකරන්නිය; කඵාවහා, සෙම්ඵලවන් නියයි; පරිකීර්තිතා, කියනලදී.

පුසුල්සමග පිසූමාංසහාමුල පලාසමගපිසූ මාංසගුණ.

434 තථාත්‍රිපුෂසංසිද්ධා රුච්‍යාඃ පිත්තකඵාපහාඃ
මත්ස්‍යසත්‍ව මූලකෛඃ සිද්ධා රුච්‍යා හෘද්‍යාශච (වහ්නිදාඃ.

තථා, එසේම; ත්‍රිපුෂසංසිද්ධාඃ, තියඹරාසමග සිද්ධකරණලද්දවූ මස්; රුච්‍යාඃ, රුචිකෙරෙයි; පිත්තකඵාපහාඃ, පිත් සෙම් පහකෙරෙයි; 434 මූලකෛඃ, මුලපලා හෝ ලිමැසමග; සිද්ධාඃ, යොදනලද්දවූ; මත්ස්‍යසත්‍ව, මස්වනාහි; රුච්‍යාඃ, රුචිකෙරෙයි; හෘද්‍යාශච, මුඛයට ප්‍රියදෙයි; වහ්නිදාඃ, අග්නියදෙයි.

අඹසමගපිසූ මාංසගුණ.

435 ආම්‍රෛර්මත්ස්‍යසත්‍ව සංසිද්ධාඃ ශූලානාහවිබද්ධනුත්
වාතශ්ලෙෂ්මහරො හෘද්‍යාඃ පාවකාඃ වහ්නිදීපනාඃ.

435 ආම්‍රෛඃ, අඹගාසමග; සංසිද්ධාඃ, යොදනලද්දවූ; මත්ස්‍යසත්‍ව, මස්වනාහි; ශූලානාහවිබද්ධනුත්, රුජා-බද්ධපිප්‍රම්-මලබඹ-යනරොගනසයි; වාතශ්ලෙෂ්මහරඃ, වාසෙම්පහකෙරෙයි; හෘද්‍යාඃ, මුඛයටප්‍රියවෙයි; පාවකාඃ, පැසවීමකෙරෙයි; වහ්නිදීපනාඃ, අග්නිදීප්තිය කෙරෙයි.

සිනිඹලාසමග පිසූමාංස ගුණ.

436 ශිම්බිසිද්ධමත්ස්‍යසත්‍ව ශොෂඝ්නාවස්තිවිශොධනාඃ
කඵවාතහරො හෘද්‍යාදීපනො භක්තරොචනඃ.

436 ශිම්බිසිද්ධ, සිනිඹලාහා යොදනලද; මත්ස්‍යසත්‍ව, මස්වනාහි; ශොෂඝ්නාඃ උෂ්ණසහිතවෙයි; වස්තිවිශොධනාඃ, මලමූත්‍රාශය ශුද්ධකෙරෙයි; කඵවාතහරඃ, සෙම්වාතනසයි; හෘද්‍ය, මුඛයටප්‍රියවෙයි; දීපනාඃ, අග්නිදීප්තිය කෙරෙයි, භක්තරොචනඃ, ආහාර රුචිකෙරෙයි.

අඹතුඩුමුසු අඹකැබලි හා සමගපිසූමාංස ගුණ.

කාසුන්දිමත්ස්‍යකො හෘද්‍යාරොචනඃකඵපිත්තජිත්.

කාසුන්දිමත්ස්‍යකඃ, අඹතුඩුමිශ්‍රවූ අඹකැබලිහා යොදනලද මස්; හෘද්‍යාඃ, මුඛයටප්‍රියවෙයි; රොචනඃ, රුචිකෙරෙයි; කඵපිත්තජිත්, සෙම්පිත් දිනයි.

අඹ පෙති සමග පිසූ මාංසගුණ.

437 ආම්‍රපෙෂිශාකො මත්ස්‍ය උෂ්ණො වහ්නිකරොමතඃ
කොලිවූමෛණිණශාකො මත්ස්‍යො රොචනඃ කඵ (ම.තනුත්

437 ආම්‍රපෙෂිශාකඃ, අඹපෙති හා සකාරණලද්දවූ; මත්ස්‍යඃ, මස්; උෂ්ණඃ, උෂ්ණවෙයි; වහ්නිකරඃ, අග්නියකෙරෙයි යනු; මතඃ, දත්තාලදී; කොලිවූමෛණිණඃ, තිප්පිලිසුණුහායුක්තවූ; ශාකඃ, සකාර

ණලද්දවූ, මත්ස්‍යඃ, මස්; රොචනඃ, රුචිකෙරෙයි; කඵවාතනුත්, සෙම්වා නසයි.

මස්බිජුගුණ 438 මත්ස්‍යාණ්ඩං බලකරං වාතඝ්නං රෝචනං පරං.

438 මත්ස්‍යාණ්ඩඃ, මස්ව්‍යඤ්ජනයතෙම; බලකරං, ශක්තිමත්කෙරෙයි; වාතඝ්නං, වාතනසයි; පරං, අතිශයින්; රොචනං, රුචිකෙරෙයි.

කලතෙලින් බැදිමාංසගුණ 439 තෛලෙන සිද්ධං මත්ස්‍යාද්‍යං ප්‍රීණනං රුචිදං (ලඝු
අරුච්‍යං ඝෘතසිද්ධන්තු ගුරුවහ්නිවිනාශනං.

තෛලෙන, කලතෙලින්; සිද්ධං, සිද්ධකරණලද්දවූ; මත්ස්‍යාද්‍යං, මස් වනාහි; ප්‍රීණනං, පිණවයි; රුචිදං, රුචිදෙයි; ලඝු, සැහැල්ලුවෙයි; 439 ඝෘතසිද්ධන්තු, ගිතෙලින් සිද්ධකරණලද්දවූ (මස්ව්‍යඤ්ජනය,) වනාහි; අරුච්‍යඃ, අරුචිකෙරෙයි; ගුරු, බරවෙයි; වහ්නිවිනාශනඃ, අග්නිමන්දය කෙරෙයි.

මාංසපිසූ ව්‍යඤ්ජන. ගුණ. ව්‍යඤ්ජනං පාකමත්ස්‍යාඪ්‍යං හෘද්‍යං වෘෂ්‍යඤ්ච පුෂ්ටිදම්.

මත්ස්‍යාඪ්‍යං, මස්යුක්තවූ; පාකම්, පිසනලද්දවූ; ව්‍යඤ්ජනං, ව්‍යඤ්ජනයතෙම; හෘද්‍යං, මුඛයට ප්‍රියවෙයි; වෘෂ්‍යඤ්ච, ධාතුපුෂ්ටියද කෙරෙයි; පුෂ්ටිදම්, පුෂ්ටිකෙරෙයි.

ඉනිව්‍යසැපනම.

බලකරණ ද්‍රව්‍යයෝ. 440 සද්‍යෝ මාංසං නවාන්නඤ්ච බාලාස්ත්‍රීක්ෂීරභෝජනම්
ඝෘතමුෂ්ණෝදකස්නානඤ්ච සද්‍යඃ ප්‍රාණකරාණි ෂට්.

440 සද්‍යඃ, එකෙණෙහි; (නසන ලද්දවූ;) මාංසං, මාංසද; නවාන්නඤ්ච, අලුත්බත්ද; බාලාස්ත්‍රී, තරුණස්ත්‍රියද; ක්ෂීරභොජනම්, කිරිඅනුභවකිරීමද; ඝෘතම්, ගිතෙල්ද; උෂ්ණෝදකස්නානඤ්ච, උණුදියද; යන ෂට්, සදෙන; සද්‍යඃ, එකෙණෙහි; ප්‍රාණකරාණි, ශක්තිමත් කරන්නාහුය.

බලනැති කරණද්. 441 පූතිමාංසං ස්ත්‍රියො වෘද්ධා බාලාර්කස්තරුණංදධි
ප්‍රභාතෙ මෛථුනං නිද්‍රා සද්‍යඃ ප්‍රාණහරාණි ෂට්.

441 පූතිමාංසං, කුණුමස් අනුභවයද; වෘද්ධා, මහලුවූ; ස්ත්‍රියඃ, ස්ත්‍රීහුද; බාලාර්කඃ, ලනිරුද හොවත් උදෑසන ඉරඅව්නෑපීමද; තරුණං, තරුණවූ හොවත් එකෙණෙහිවූ; දධි, දීඅනුභවයද; ප්‍රභාතෙ, උදය කාලයෙහි; මෛථුනං, මෛථුනසේවනයද; නිද්‍රා, නිදීමද; ෂට්, සන ම්සය; සද්‍යඃ, එකෙණෙහි; ප්‍රාණහරාණි, බලපහකෙරෙත්.

පිනිආදි සිසිල් සෙවන ගුණ. 442 ශිශිරං ශීතලං වෘෂ්‍යං රූක්ෂං වාත ප්‍රකොප (නම්

442 ශීතලඃ, ශීතලුවූයෙනම; වෘෂ්‍යං, ධාතුපුෂ්ටිකෙරෙයි; ශිශිරං, පිනි (සෙව්නාය) නෙම; රූක්ෂං, (ශරීරය) රළුවෙයි; වාත ප්‍රකොපනම්, වාතකොප කෙරෙයි.

ශයනාස ⎫
නගුණ. ⎭ 443 සුඛශයනාසනං සෙව්‍යං නිද්‍රාපුෂ්ටිධෘතිප්‍රදම්
ශ්‍රමානිලහරං වෘෂ්‍යං විපරීතමතොන්‍යථා.

443 සෙව්‍යං, සෙව්නායකටයුතුවූ; සුඛශයනාසනං, සැපවූ ශයනාසනයෙනම; නිද්‍රා, නිද්‍රාවද; පුෂ්ටි, පුෂ්ටියද; ධෘතිප්‍රදම්, ධෛර්‍ය්‍යයද දෙයි; ශ්‍රමානිලහරං, විඩාවහා වාතයනසයි; වෘෂ්‍යං, ධාතුපොෂණය කෙරෙයි; අතඃ, මෙයින්; අන්‍යථා, අන්පරිද්දෙකින් විනම්; විපරීතං, වෙනස්වූගුණ ඇතිවෙයි.

ශතපුෂ්පපත්‍රකු ⎫
රූක්ෂසුම්ගුණ ⎭ 444 ශතපුෂ්පා තු මධුරා වාතපිත්තහරා ගුරුඃ
ශලිෂ්මාදීපනස්තීක්ෂ්ණඃ පලිතාශීඃ කඵවාතජිත්.

444 ශතපුෂ්පාතු, ශතපුෂ්පනොමෝ; මධුරා, මිහිරිවන්නීය; වාතපිත්තහරා, වාපිත් නසන්නීය; ගුරුඃ, බරවන්නීය; ශලිෂ්මඃ, කුරුක්ෂුමනෙම; දීපනඃ, අග්නිදීපනිය කෙරෙයි; තීක්ෂ්ණඃ, තීක්ෂ්ණවෙයි; පලිතාශීඃ, පිලාහා අශීස්ද; කඵවාතජිත්, සෙම්වාදෙකද යනමෙය ජයගණී.

445 ශාකෙෂු සර්වේෂු වසන්තිරොගා
රොගො හි දෙහස්‍ය විනාශහෙතුඃ,
තස්මාද්බුධඃ ශාකවිවර්ජිතඤ්ච
කාර්ය්‍යං තථාම්ලෙෂු ස එව දොෂඃ.

445 සර්වේෂුශාකෙෂු, සියලු පලාවර්ගයන්හි; රොගාඃ, රොගයෝ; වසන්ති, වෙසෙත්; රොගඃහි, රොගයවනාහි, දෙහස්‍ය, ශරීරයාගේ; විනාශහෙතුඃ, නැසිමට හෙතුවේ; තස්මාත්, එහෙයින්; බුධඃ, පණ්ඩිතනෙම; ශාකවිවර්ජිතඤ්ච, පලාවර්ග දුරුකිරීම; කාර්ය්‍යං, කටයුතු; තථා, එසේම; අම්ලෙෂු, ඇඹුල්වර්ගයන් කෙරෙහි; සඃදොෂඑව, ඒ පලාවර්ගසමාන දොස්ඇත්තේමය.

446 ශිලමොචි තික්තකාඩි බ්‍රහ්මිමූලකපත්‍රිකා
ශාකෙ පටොලවාස්තූකකාකමාචිපුනර්නවං.

446 ශිලමොචි, මුලපලාද; තික්තකාඩි, තිත්තදඹුඇතිපලා හෝ තිත්තඩාංවාපලාද; බ්‍රහ්මි, බුගුණුවැන්නද; මූලක, අගුත්මුලපලාද; පත්‍රිකා, උඩත්තද; පටොල, දුම්මැල්ලද; වාස්තූක, තිල්තම්පලාද; කාකමාචි, කළුකැම්මෙරියද; පුනර්නවා, පිටසුදුපලාද; ශාකෙ, හැර; (අනික්පලා හරණිය).

පුසුල්කැ ⎫ 447 ත්‍රපුෂෛර්වාරුකෙ සවාදු ගුරුවිෂ්ටම්භිශීතලෙ
කිරිගුණ. ⎭ මුඛප්‍රියෙඤ්ච රූක්ෂෙඤ්ච මූත්‍රලං ත්‍රපුෂංත්වති.

447 ත්‍රපුෂෛර්වාරුකෙ, පුසුල්හා කැකිරිදෙක; ස්වාදු, මධුරවෙන්; ගුරු, බරවෙයි; විෂ්ටම්භිශීතලෙ, මලබද්ධයහා ශීතලසනාදෙක වෙන්; මුඛප්‍රියඤ්ච, මුඛයට ප්‍රියදවෙයි; රූක්ෂඤ්ච, රළුදවෙයි; ත්‍රපුෂනාමූ, පුසුල්වනාහි; අතිමූත්‍රලම්, අතිශයින් මූත්‍රවඩයි.

සුදුසඳුන්හා හි ගුරුපියලිගුණ. { 448 චන්දනං ශීතලං තික්තං තෘෂ්ණාදාහාස්‍රපිත්තනුත් ශටීවාතකඵශ්වාසකාසජ්වරවිනාශිනී.

448 චන්දනං, සුදුහඳුන්තෙම; ශීතලං, සිසිල්වෙයි; තික්තං, තිත්ත වෙයි; තෘෂ්ණාදාහාස්‍රපිත්තනුත්, පිපාසය-දාහය-රක්තපිත්තය යන මේ නසයි; ශටී, සිගුරුපියලිතොමෝ; වාත, වාතය; කඵ, සෙම්ය; ශ්වාස, ශ්වාසය; කාස, කාසය; ජ්වරවිනාශිනී, උණය යනමේ රොග; නසන්නීය.

සත්කුප්පගුණ—449 ශතාහ්වානිලදාහාම ශූලතෘට් ඡර්දිනාශිනී.

449 ශතාහ්වා, සතකුප්පතොමෝ; අනිල, වාතයද; දාහ, දැවිල්ල්ද; ආමශූල, ආමරුජාවද; තෘට්, පිපාසයද; ඡර්දිනාශිනී, වමනයද යන මේ නසයි.

සිද්දිගුරු ගුණ. { ශුණ්ඨී තු කඵවාතඝ්නී සස්නේහා ලඝුදීපනී 450 විපාකෙ මධුරා වෘෂ්‍යා හෘද්‍යොෂ්ණා කටුරේචනී.

450 ශුණ්ඨී, සිද්දිගුරුතොමෝ; කඵවාතඝ්නී, සෙම්වා නසන්නීය; සස්නේහා, තෙල්සහිතවන්නීය; ලඝුදීපනී, මදක්අග්නිය වඩන්නීය; විපාකෙ, පැසීමෙහි; මධුරා, මිහිරිවන්නීය; වෘෂ්‍යා, ධාතුපොෂණය කරන්නීය; හෘද්‍යා, මනොඥවන්නීය; උෂ්ණා, උෂ්ණවන්නීය; කටු, කුළුරසවන්නීය; රේචනී, විරේචන කරන්නීය.

අස්වැන්න හා සාතාවාරියගුණ. { ශාලපර්ණී තු කාසඝ්නී ග්‍රාහිණී කඵපිත්තජිත් 451 ශතාවරී වාතපිත්තමෙහඝ්නී ගරා සරා.

ශාලපර්ණීතු, අස්වැන්නතොමෝ; කාසඝ්නී, කාසය නසන්නීය; ග්‍රාහිණී, මලබද්ධකරන්නීය; කඵපිත්තජිත්, සෙම්පිත් නසන්නීය; 451 ශතාවරී, සාතාවාරියතොමෝ; වාතපිත්තමෙහක්ෂයඝ්නීගරා, වාතය-පිතය-ප්‍රමෙහය-ක්ෂයය යනාමේනසන්නීය-ගරා, සාරවන්නීය.

ඉරමුසු හා මහරිගුණ. { 452 ශාරිවා වාතපිත්තඝ්නා තෘට්ඡර්දිජ්වරනාශිනී ශිරීෂො විෂවීසර්පී ස්වෙදත්වග්දොෂ ශොථජිත්.

ශාරිවා, ඉරමසුතොමෝ; වාතපිත්තඝ්නා, වාපිත්නසන්නීය; තෘට්ඡර්දිජ්වරනාශිනී, පිපාසය-වමනය-උණය යන මේ නසන්නීය. 452 ශිරීෂ, මහරිතෙම; විෂ, විෂය; වීසර්පී, සෙඩිය; ස්වෙද, ඩහය; ත්වග්දොෂ, ඡවිදොෂය; ශොථජිත්, ඉදිමුමය යන මේ ජයගණී.

ෂට් රස ගුණ.
ස්වාද්වම්ලලවණා වායුං කෂායස්වාදුතික්තකාඃ
453 ජයන්ති පිත්තං ශ්ලේෂ්මාණං කෂායඃ කටුතික්තකාඃ
කට්වම්ලලවණාඃ පිත්තං ස්වාද්වම්ලලවණාඃ කඵම්
454 කටුතික්තකෂායාශ්ච කෝපයන්ති සමීරණම්.

453 ස්වාද්වම්ලලවණාඃ, මධුරරස-ලුණුරස-ඇඹුල්රස යනමොවුහු; වායුං, වාතයද; කෂායස්වාදුතික්තකාඃ, කසට්-මිහිරි-තිත්ත යන මේරසයෝ, පිත්තං; පිතද, කෂායඃ, කසටරසද; කටුතික්තකාඃ, කටු රසහා තිත්තරසද යනමොවුහු; ශ්ලේෂ්මාණං, සෙම්ද, ජයන්ති, ජය ගනිත්; කට්වම්ලලවණාඃ, කටුස-ඇඹුල්ස-ලුණුස යනමේ රසයෝතු; පිත්තං, පිතද; ස්වාද්වම්ලලවණාඃ, මධුරරස-ඇඹුල්රස-ලුණුරස යනමොහු; කඵම්, සෙමද; 454 කටුතික්තකෂායාඃ, කටුතික්තකසට යන රසයෝ සමීරණංච, වාතයද; කෝපයන්ති, කෝපකෙරෙත්.

නෑමේ ගුණ:
ස්නානං පවිත්‍රමායුෂ්‍යං ශ්‍රමස්වේදමලාපහම්
455 ශරීරවලසන්ධානං කේශ්‍යමෝජස්කරං පරම්.
උෂ්ණාම්බුනාධඃ කායස්‍ය පරිෂේකෝ බලාපහඃ
456 තේනෛවතූත්තමාඞ්ගස්‍ය වලකෘත් කේශචක්ෂුෂෝඃ.

455 ස්නානං, ස්නානයතෙම; පවිත්‍රං, පිරිසිදුකෙරෙයි; අයුෂ්‍යං, ආයුසටහිතවෙයි; ශ්‍රමස්වේදමලාපහම්, විඩා-ඩහදිය-මල යන මේ පහ කෙරෙයි; ශරීරවලසන්ධානං, ශරීරබලරැස්කෙරෙයි; කේශ්‍යම්, ඉස කෙස්වඩයි; ඔජස්කරං, ඔජස්ඇතිකෙරෙයි; පරම්, උතුම්වෙයි; 456 උෂ්ණාම්බුනා, උණුදියෙන්; අධඃකායස්‍ය, යටශරීරයාගේ පරිෂෙකඃ; තෙම්මතෙම, බලඅපහඃ; බලනසයි; තෙනඑවතු, ඒ උණුදියෙන්මවනාහි; උත්තමාඞ්ගස්‍ය, ශීර්ෂයාගේ පරිෂෙකයතෙම, වලකෘත්; බලවඩයි; කේශචක්ෂුෂොඃ, කෙසහාඇස් යන දෙදෙනාට හිතවෙත්.

ඉස නෑම:
විනිහන්ති ශිරඃස්නානං තෘෂ්ණා තාලුශෝෂණම්
457 මලොෂ්ණපිඩකාකණ්ඩුශිරෝරෝගාංශ්චපෛත්තිකාන්.

457 ශිරස්නානං, ඉසතෙමා නෑම හෝ දියෙහි ගිලී නෑමතෙම; තෘෂ්ණා, පිපාසයද; තාලුශොෂණං, තල්ල හා තොල් වියලීමද; මල, මලද; උෂ්ණ, (ශරීරයෙහි) උෂ්ණයද; පිඩකා, වුණද; කණ්ඩු, ගඩුද; පෛත්තිකාන්, පිතින්උපදනාවූ; ශිරෝරොගාන්ච, ඉසෙහි රෝගයන්ද; විනිහන්ති, නසා.

නෑමනුසු දුසුතැන්.
ස්නානමර්දිතනේත්‍රාස්‍යකර්ණරෝගාතිසාරිෂු
458 ආධ්මානපීනසාජීර්ණභුක්තවත්සුච ගර්හිතං.

458 ස්නානම්, ස්නානයතෙම; අර්දිත, ඇර්දිතරෝගය හෙවත් බැම පහරණරුජාය; නේත්‍ර, නේත්‍රරෝගය; ආස්‍ය, මුඛරෝගය; කර්ණ රෝග, කර්ණරෝගය; අතිසාරිෂු, අතිසාරරෝග යනමේ ඇත්තවුන්

කෙරෙහිද; ආධ්මාන, බඩපිපුමද; පීනස, ප්‍රතිශ්‍යායද; අජීර්ණ, අජීර්ණයද සහමෙරොග ඇත්තවුන් කෙරෙහිද; භුක්තවත්සුව, අනුභව කළවුන් කෙරෙහිද; ගර්භිනං, ගර්භාකරණිලද්දී.

සුවඳ ඇඟ ගෑම්ගුණ. 459 ප්‍රීත්‍යොජොබලිනං වෘෂ්‍යං සෞගන්ධදෞර්ගන්ධ්‍යනාශනම් තන්ද්‍රාපාපොපශමනං ශ්‍රමඝ්නමනුලෙපනම්.

459 අනුලෙපනම්, සුවඳ ඇඟගෑල්වීම; ප්‍රීත්‍යොජොබලිනං, ප්‍රීතිය හා ඕජස බලිනය කෙරෙයි; වෘෂ්‍යං, ධාතුපුෂ්ටියකෙරෙයි; සෞගන්ධ දෞර්ගන්ධ්‍යනාශනම්, සුගඳිය හා දුගඳබව නසයි; තන්ද්‍රා, අලසබවද; පාපොපශමනං, පාපයද සංසිඳීමකෙරෙයි; ශ්‍රමඝ්නං, විඩාවනසයි.

අඹපලාහාකිඹු ල්වැන්නගුණ 460 සාම්පං ක්‍රිමිලං ස්වාදු ත්‍රිදොෂරක්තපිත්තකෘත් අවිදාහි ත්‍රිදොෂඝ්නඃ සංග්‍රාහී සුනිෂණ්ණකඃ.

460 සාම්පං, අඹපලාතෙම; ක්‍රිමිලං, ක්‍රිමින්බහුලවෙයි; ස්වාදු, මධුරවෙයි; ත්‍රිදොෂරක්තපිත්තකෘත්, තුන්දොස්හා රත්පිත්වඩයි; සුනිෂණ්ණකඃ; කිඹුල්වැන්න (පලා) තෙම; අවිදාහි, දාහාධික නොවෙයි කොහොත් අජීර්ණනොකෙරෙයි; ත්‍රිදොෂඝ්නඃ, තුන්දොස් නසයි; සංග්‍රාහී, මලබද්ධකෙරෙයි.

සිඳුලුණු ගුණ. 461 සෛන්ධවං දොෂජිද්වෘෂ්‍යං චක්ෂුෂ්‍යමවිදාහිච අග්නිසන්දීපනං ස්නිග්ධං රොචනං මධුරං ලඝු.

461 සෛන්ධවං, සිඳුලුණුතෙම; දොෂජිත්, තුන්දොස් ජයගණී; වෘෂ්‍යං, ධාතුපොෂණයකෙරෙයි; චක්ෂුෂ්‍යං, ඇසටහිතවෙයි; අවිදාහිච, දාහාධිකනොවේහෝ පිත්නොවඩා; අග්නිසන්දීපනං, අග්නිදීප්තියකෙරෙයි; ස්නිග්ධං, සිනිඳුවෙයි; රොචනං, රුචිකෙරෙයි; මධුරං, මිහිරිවෙයි; ලඝු, සැහැල්ලුවෙයි.

සුවස ලුණුගුණ. 462 සෞවර්චලං රුචිකරං විශෙෂොෂ්ණං විශදං කටු ගුල්මශූලවිබන්ධඝ්නං කිඤ්චිත්පිත්තකරං ලඝු.

462 සෞවර්චලං, සුවසලුණුතෙම; රුචිකරං, රුචිකෙරෙයි; විශෙෂොෂ්ණං, උෂ්ණවීර්යවෙයි; විශදං, පිරිසිඳුහෙයෝ සුදුවෙයි; කටු, කුළුරසවෙයි; ගුල්මශූලවිබන්ධඝ්නං, ගුල්මය-ශූලය-මලබද්ධය යනමෙනසයි; කිඤ්චිත්පිත්තකරං, මඳක්පිත්වඩයි; ලඝු, සැහැල්ලුවෙයි.

උද්භිදලුණුගුණ 463 ඖද්භිදං තීක්ෂ්ණමුෂ්ණලද්දි සක්ෂාරං කටුතික්තකම් විබන්ධානාහශූලඝ්නං ලොකෙ සාම්භරිසංඥකම්.

463 ලොකෙ, මේලෝකයෙහි; සාම්භරිසංඥකම්, සාම්භරිය නානාමි ඇති; ඖද්භිදං; උද්භිදලුණුතෙම; තීක්ෂ්ණම්, තියුණුවෙයි; උෂ්ණලද්දි දුශීඝ්‍රවෙයි; සක්ෂාරං, ලුණුරසසහිතවූ; කටුතික්තකා, කුළුරසහා; තිත්තරසවෙයි, විබන්ධානාහ ශූලඝ්නං, මලබද්ධ-බඩපිපුම් රුජා නසයි.

පෙරුන්කායම්ගුණ. { ශ්ලේෂ්මඝ්නං පාචනං භාස්කරසතීක්ෂ්ණං වහ්නිවර්ධනං
464 විරූක්ෂණං ශූලහරං භේදි ච බලවර්ධනං. (තෘ:

464 රාමඨකස්සාරඃ, පෙරුංකායම්තෙම; ශ්ලේෂ්මඝ්නඃ, සෙම්නසයි; තීක්ෂණඃ, තියුණුවෙයි; වහ්නිවර්ධනඃ, අග්නියවඩයි; විරූක්ෂණඃ, රළු කෙරෙයි; ශූලහරඃ, ශූලනසයි; භේදී, මලබිඳීම්කෙරෙයි; බලවර්ධනංච, බලවැඩීමද කෙරෙයි.

අඹගුණ. { සහීපඃ කඵවාතඝ්නඃ තීක්ෂ්ණෝෂ්ණෝ රක්තපිත්තකෘත්
465 කටුකඃ කෘමිකොෂ්ඨඝ්නඃ සිධාව්ගව්‍යාපි තද්ගුණඃ.(සෘත්

465 සහීපඃ, අඹතෙම; කඵවාතඝ්නඃ, සෙම්වාතනසයි; තීක්ෂ්ණෝෂ්ණඃ, තියුණුහා උෂ්ණවෙයි, රක්තපිත්තකෘත්; රත්පිත්වඩයි, කටුකඃ; කුළුරසවෙයි; කෘමිකොෂ්ඨඝ්නඃ, කෘමිරොගහා කුක්ෂිරොගනසයි; සිඩාවව්අපි, හෙලඅඹද; තද්ගුණඃ, ඒඅඹසමාන ගුණඇත්තේය.

සුලුදඬ ගුණහා බෝදිඇටවැල් ගුණ. { ශක්‍රාශනං හර්ෂමේධාප්‍රදං හි ශ්ලේෂ්මශොථජිත්
466 අවල්ගුජඃ වාතකඵත්වග්දොෂනාශනඃ.

466 ශක්‍රාශනං, සුලුදඬතෙම; හර්ෂමේධාප්‍රදං, ප්‍රීතියහා ප්‍රඥාවදෙයි; ශ්ලේෂ්මශොථජිත්, සෙමහා ඉදිමුමනසයි; අවල්ගුජඃ, බෝදිතෙම; වාතකඵ, වාතයහා සෙමද; කුෂ්ඨත්වග්දොෂනාශනඃ, කුෂ්ඨයහා ත්වග්දොෂය නසයි.

මුරුංගාගුණ.—සොභාඤ්ජනඃ කටුස්තීක්ෂ්ණඃ ශොථවිද්‍රධිගුලනුත්.

සොභාඤ්ජනඃ, මුරුංගාතෙම; කටුඃ, කුළුරසවෙයි; තීක්ෂ්ණඃ, තියුණුවෙයි; ශොථවිද්‍රධිගුලනුත්, සොථය-ගෙඩිය-රුජාය යන මේ නසයි.

ඇසලගුණ. { 467 රාජවෘක්ෂෝ'ධිකඃ පථ්‍යා මෘදුර්මධුරශීතලඃ
තත්ඵලං මධුරං වෘෂ්‍යං වාතපිත්තහරඃ සරඃ.

467 රාජවෘක්ෂඃ, ඇසලතෙම; අධිකඃපථ්‍යඃ, බොහෝසේපථ්‍යවෙයි; මෘදුඃ, මෘදුවූ විරේචනරකරෙයි; මධුරශීතලඃ, මිහිරිහා ශීතලවෙයි; තත්ඵලං, ඒඇසලඵලතෙම; මධුරං, මධුරවෙයි; වෘෂ්‍යං, ධාතුපොෂණයකෙරෙයි; වාතපිත්තහරඃ, වාපිත්නසයි; සරඃ, සාරවෙයි.

මෛථුන සේවන ගුණ } 468 ව්‍යවායො ධාතුක්ෂයං කුරුතෙ රත්‍යපත්‍යදඃ.

468 ව්‍යවායඃ, මෛථුනසෙවනයතෙම; ධාතු අපචයං, ධාතුක්ෂය කිරීමද; රති, සන්තොෂයද; අපත්‍යදඃ, පුත්‍රයන්දීමහෝ ගොත්‍රයාගේ උත්පත්තියද; කුරුතෙ, කෙරේ.

අධිකමෛථුනය—අතිව්‍යවායාජ්ජායන්තෙ ශ්වාසකාසජ්වරාදයඃ.

අතිව්‍යවායාත්, අධික මෛථුනය හෙතුකොටගෙණ; ශ්වාසකාසජ්වරාදයඃ, ශ්වාසය-කාසය-උණය යනමේආදිරොගයෝ;ජායන්තෙ, උපදිත්.

යෞවන යෙ ⎱ 469 අසෙවනාත්මෙහමෙදඃ ග්‍රන්ථිවාතගඩමාදිවම
හිඅසෙවනය. ⎰ ඉන්ද්‍රියානාංඤ්ච ජඩතා ප්‍රාප්‍යතෙ යෞවනෙජනෛඃ.

469 යෞවනෙ, තරුණඅවස්ථාවෙහි; ජනෛඃ, ජනයන් විසින්; අසෙවනාත්, (මෛථුන්දම්) සෙවනය නොකිරීම හෙතුකොටගෙන; මෙහ, ප්‍රමෙහයද; මෙදඃ,මෙදස්රෝගද; ග්‍රන්ථිවාතගඩ, ග්‍රන්ථිරොගය හා වාතයද; මාදිවම්, ශරීරයාගේ මෘදුබවද; ඉන්ද්‍රියානං, ඉන්ද්‍රියයන්ගේ; ජඩතා, ජඩබවද; ප්‍රාප්‍යතෙ, පැමිණේ.

ස්ත්‍රීන්ද ⎱ 470 බාලස්ත්‍රී ප්‍රාණද ප්‍රොක්තා තරුණී ප්‍රාණධාරිණී
ක්වීම. ⎰ ප්‍රෞඪා කරොති වෘද්ධත්වං වෘද්ධාමරණමාදිශෙත්.

470 බාලස්ත්‍රී, බාලස්ත්‍රීසෙවනයතොමෝ (සොළොස් අවුරුද්දපටන් සොළොස්අවුරුද්ද ඉම්කොට ඇති ස්ත්‍රීසෙවනය තොමෝ;) ප්‍රාණද, ජීවිතශක්තියදෙන්නීය; තරුණී, තරුණස්ත්‍රීසෙවනය තොමෝ; (සොළොස්අවුරුද්දපටන් තිස්අවුරුද්ද ඉම්කොට ඇත්තී) ප්‍රාණධාරිණී, බලවඩන්නියයි; ප්‍රොක්තා, කියනලද්දී; ප්‍රෞඪා, තිස් අවුරුද්දපටන් පනස්අවුරුද්ද ඉම්කොට ඇති ස්ත්‍රීසෙවනය තොමෝ; වෘද්ධත්වං, මහලුභාවය; කරොති, කෙරේ; වෘද්ධා, මහලු ස්ත්‍රී (සෙවනය) තොමෝ; මරණං, මරණය; ආදිශෙත්, දක්වන්නේය.

අරළුගුණ. ⎱ 471 පථ්‍යා පංචරසායුෂ්‍යා චක්ෂුෂ්‍යා ලවණා සරා
⎰ මෙධ්‍යොෂ්ණා දීපනී සර්වදොෂශොථව්‍රණාපහා.

471 පථ්‍යා, අරළුතොමෝ; පංචරසා, පඤ්චරසයෙන් යුක්තවන්නී ය; ආයුෂ්‍යා, ආයුෂට හිතවන්නීය; චක්ෂුෂ්‍යා, ඇසට හිතවන්නීය; ලවණා, ලුණුරස (ප්‍රධාන) වන්නීය; සරා, සාරවන්නීය; මෙධ්‍යා, ප්‍රඥාඇති කරන්නීය; උෂ්ණා, උෂ්ණවන්නීය; දීපනී, ඇනිදීපනිය කරන්නීය; සර්වදොෂ, තුන්දොස්ද; ශොථ, ඉදිමුම්ද; ව්‍රණඅපහා, වණද යන මේ නසන්නීය.

අරළුජාති ⎱ 472 ජීවන්ති රොහිණී චෛව විජයාචාභයාමෘතා
දක්වීම. ⎰ පූතනා කාලිකා චෛව පථ්‍යාසප්තවිධාමතා.

472 ජීවන්ති, ජීවන්තිනම් අරළුද; රොහිණීචඑව, රොහිණීනම් අරළුද; විජයා, විජයානම්අරළුද; අභයාච, අභයානම්අරළුද;අමෘතා, අමෘතානම් අරළුද; පූතනා, පූතනානම්අරළුද; කාලිකාච එව, කාලිකානම් අරළුදයන; පථ්‍යා, අරළුතොමෝ; සප්තවිධා, සප්තවිධවන්නියයි; මතා, දන්නාලද්දී.

473 සුවර්ණවර්ණා ජීවන්ති රොහිණී කපිලද්‍යුතිඃ
අලාබුවෘන්තා විජයා පඤ්චාංශා චාභයාමෘතා.

474 ස්ථූලමාංසාමෘතාඥෙයා පූතනාස්ථිමතීස්මෘතා
ත්‍ර්‍යංශා ච කාලිකෙත්‍යෙවං සප්තජාති හීතකී.

473 සුවණ්ණවණ්ණා, රන්පැහැඇත්තී; ජීවන්ති, ජීවන්තිනම් වන්නී ය; කපිලද්දුති, පිඟුපැහැඇත්තී, රොහිණී, රොහිණීනම්වන්නීය; අලාබුවණ්ණා, ලබුමෙන්වට්ටුවූ; විජයා, විජයානම්වන්නීය; පසද්වංශා, අංගපසක්ඇත්තී හෙවත් ප්‍රත්‍යංගඇත්තී; අභයා, අභයානම් වන්නියයි; සමානා, දන්නාලදි. **474** ගුලුමංසා, බොහෝ මස්ඇත්තී; අමෘතා, අමෘතායයි; ශ්‍රෙයා, දනයුත්තීය; අණිමන්ති, ඇටඇත්තී හෙවත් ඇටසමහන්ව මස් ගොලුපවන්නී; පූතනා, පූතනායයි; සමානා, දන්නාලදි; තුෂංශා, රේඛාතුනක් ඇත්තී; කාලිකාවණ්ණී, කාලිකානම් වන්නීයයි; හරීතකිසප්තජාති, අරළු ජාතිහත හොමෝ; එවං, මෙසේ (දනයුතු)

475 සෙනහපාකෙසු සබ්බේසු ජීවන්ති තු පූජ්‍යතෙ
රොහිණී ඛයරොගෙසු විජයා සබ්බකම්මසු.

476 පූතනා ලෙපනෙ ශ්‍රෙයා අමෘතාතු විරෙචනෙ
අභයා නෙත්‍රරොගෙෂු ගන්ධයුක්තාෂු තු කාලිකා.

475 සබ්බේසුසෙනහපාකෙසු, සියලුතෙල්පාකයන්හි; ජීවන්තිතු, ජීවන්තිනම්අරළුද; ඛයරොගෙසු, ක්‍ෂයරොගයන්කෙරෙහි; රොහිණී, රොහිණී අරළුහොමෝද; සබ්බකම්මසු, අනාගතක්‍රියාවන්හි හෙවත් තෙජස් වර්ධනයකරණ ක්‍රියාවන්හි; විජයා, විජයානම අරළුද; පූජ්‍යතෙ, පසස්නාලැබේ. 476 ලෙපනෙ, ආලෙපයෙහි; පූතනා, පූතනානම් අරළුද; විරෙචනෙතු, විරෙචනයෙහි වනාහි; අමෘතා, අමෘතාය නම් ඇති අරළුද; නෙත්‍රරොගෙෂු, නෙත්‍රරොගයන්හි; අභයා, අභයානම් අරළුද; ගන්ධයුක්තාෂු, සුගන්ධයෙදීමෙහි වනාහි; කාලිකා, කාලිකානම අරළුද; ශ්‍රෙයා, දනයුතුතීය.

477 හරීතකී මනුෂ්‍යාණාං මාතෙව හිතකාරිණී
කදාචිත් කුප්‍යතෙ මාතා නොදරස්ථා හරීතකී.

477 හරීතකී, අරළුහොමෝ; මනුෂ්‍යාණාං, මනුෂ්‍යයන්ට; මාතාඉව, මවන්මෙන්; හිතකාරිණී, මඞ්ගල්‍යය කරන්නීය හෙවත් වැඩසිදුකරන්නීය; මාතා, මවහොමෝ; කදාචිත්, කිසිකලෙක්හි; කුප්‍යතෙ, කිපේ; උදරස්ථා, කුසෙහිවූ; හරීතකී, අරළුහොමෝ; න, (කිසිකලෙකත්) නොකිපේ.

ඉති හරීතකී වග්ග.

වැල්නිගුණ 478 ගිලෙමාව සරා හිතා කුෂ්ඨඝ්නී ගෙලඹෙටිනත
(නූන්

478 ගිලමොව, වැල්නිගුණහොමෝ; සරා, සාරවන්නීය; හිතා, හිතවන්නීය; කුෂ්ඨඝ්නී, කුෂ්ඨය නසන්නීය; ගෙලඹෙටිනතනූන්, හෙම්පිත් නසන්නීය.

පෙරුංකා | සම් ගුණ. 479 තිඩගු තීක්‍ෂ්ණං කටුරසං ශුල්‍යාජ්‍ණීර්ණවහ්නිනුත්
ලඝුෂ්ණං පාචනං ශෝධනං දීපනං කඵවාතජිත්.

479 හිඞ්ගු, පෙරුංකායම්තෙම; තීක්ෂණං, තියුණුවෙයි; කටුරසං, කුළුරසවෙයි; ශූලාජීර්ණවිබන්ධනුත්, රුජාවය-අජීර්ණය-මලබද්ධය යන මෙය නසයි; ලඝූෂ්ණං, සැහැල්ලූෂ්ණවෙයි; පාචනං, පැසවීම කෙරෙයි; ස්නිග්ධං, සිනිදුවෙයි; දීපනං, අග්නිදීප්තිය කෙරෙයි; කඵවාතජිත්, සෙම්වා දිනායි.

කහ ගුණ හා රත්එරඬුගුණ. { හරිද්‍රා කඵවාතාස්‍රක් ශෝථකණ්ඩු ව්‍රණාපහා
480 හස්තිකර්ණීඃ පරං වාතඝ්නා මේධායුර්බලවර්ධනා.

480 හරිද්‍රා, කසාතොමෝ; කඵවාතාස්‍රක්, සෙම හා රත්පිත්ද; ශෝථකණ්ඩුව්‍රණඅපහා, ඉදිමුමය-ගඩුය-ව්‍රණය යනමේ පහකරන්නීය; හස්තිකර්ණීඃ, රත්එරඬුතෙම; පරං, අතිශයින්; වාතඝ්නඃ, ධාතුපුෂ්ටියකෙරෙයි; මේධායුඃ, ප්‍රඥාවහා ආයුෂද; බලවර්ධනා, ශක්තියදවඩයි.

හාඩ්ගොඩාගුණ.—අස්ථිභග්නෙස්ථිසංහාරො හිතො වල්‍යානිලාපහඃ

අස්ථිසංහාරඃ, හාඩ්ගොඩාතෙම; අස්ථිභග්නෙ, ඇටබිඳීමෙහි; හිතඃ, හිතවෙයි; වල්‍යඃ, බලවඩයි; අනිලාපහඃ, වාතය නසයි.

කොබෝවක්කා සහ කටුකරඬුගුණ. { 481 සුයම්භාවතී විබන්ධඝ්නඃ පෞරීයකඵවාතජිත්

481 සුයම්භාවතීඃ, කොබෝවක්කාතෙම, විබන්ධඝ්නඃ, මලබද්ධ නසයි; පෞරීය, කටුකරඬුතෙම; කඵවාතජිත්, සෙම්වා දිනයි.

කටරොළු සහ කොළොම් ගුණ. { ආස්ඵෝතා විෂකුෂ්ඨඝ්නී නිලිශො දාහපිත්තනුත්.

ආස්ඵෝතා, කටරොළුතොමෝ; විෂකුෂ්ඨඝ්නී, විෂහා කුෂ්ඨ නසන්නීය; නිලිශඃ, කොළොම්තෙම; දාහපිත්තනුත්, දාහයහා පිත්තනසයි.

කරකම්ගුණ—485 | පෞෂ්ටිකං ධන්‍යමායුෂ්‍යං ශුචි රූපවිරාජනම්
කේශශ්මශ්‍රුනඛාදීනාං කර්තනං සම්ප්‍රසාදනම්.

482 කෙශා, ඉසකේද; ශ්මශ්‍රු, රැවුලද; නඛාදීනාං, නියය යනමේ ආදීන්ගේ; කර්තනං, කැපීමතෙම; පෞෂ්ටිකං, ධාතුපුෂ්ටිය කෙරෙයි; ධන්‍යං, භාග්‍යවෙයි; ආයුෂ්‍යං, ආයුෂට හිතවෙයි; ශුචි, පවිත්‍රවෙයි; රූපවිරාජනං, රූපය බබලයි; සම්ප්‍රසාදනම්, චිත්තප්‍රසන්නවෙයි.

පැපිළියගුණ—පර්පටඃ පිත්තජිද්දාහජ්වරජිත් කඵශොෂණඃ.

පර්පටඃ, පැපිළියතෙම; පිත්තජිත්, පිත්තනසයි; දාහජ්වරජිත්, දාහජ්වරයදිනායි හෙවත් නසයි; කඵශොෂණඃ, සෙම්වියළීමකෙරේ.

ශු ෂො ෂ ං ස මා ප්තඃ.

වෛද්‍යශාස්ත්‍රය සම්බන්ධ පොත්.

		රු. ශත.
අලංකීර්ණ චින්තාමණි	,,	25
අනුපාන මංජරිය	,,	25
අජීර්ණ මංජරිය	,,	10
අරිෂ්ට මාලාව	,,	10
අරිෂ්ට ශතකය	,,	25
අභිනව යෝග මුක්තාවලිය	,,	25
අරිෂ්ට දවලිය	,,	12
අක්ෂිරෝග සිතුමිණ	,,	12
ඇස්වෙද පොත	,,	25
උඩරට බෙහෙත්ගෙයි අත්වෙදපොත		15
ඔවාසිතුමිණ	,,	12
ඖෂධ මුක්තාහාරය	,,	18
කාණ්ඩමාල ඖෂධ සංග්‍රහව	,,	12
කාමදේවජද වෛද්‍ය සංග්‍රහව	,,	12
කාමරෝග දීපනිය	,,	50
කාමවිලාසය	,,	12
කුමාරෞෂධ මාලාව	,,	31
කුමාර ජීවනිය	,,	30
කුමාරෞෂධ දර්පණය	,,	50
කෝල විධිය	,,	15
ගව්සිඩ සාරය	,,	37
ගුණපාඨය	,,	25
චක්ෂුද්‍රත්නය 1 වෙනි කාණ්ඩය	,,	62
එම 2	,,	37
චයුම්සිරාව	,,	37
තිපල්වණ්ණාව	,,	12
තෛලදව ශතකය	,,	50
ත්‍රිදෝෂ සන්නිපාතය	,,	25
නිදානදීපය	,,	50
පරිභා පරිශය	,,	62
ප්ලීහාප්‍රකරණය	,,	25
පිස්සුබල් වෙදපොත	,,	25
පොතුවිල අත්වෙද පොත	,,	50
ප්‍රත්‍යක්ෂ ඖෂධ සංග්‍රහව	,,	10
ප්‍රමේහෞෂධ මංජරිය 1 වෙනි	,,	25
එම 2 වෙනි	,,	15
බෙහෙදව තෙල් පොත	,,	25
භෛෂජ්‍ය මංජුසාව 1, 2 කාණ්ඩයන්		62
භෛෂජ්‍ය කල්පය 2. 3. කාණ්ඩයන්		62
භෛෂජ්‍යාදී අකාරාදිය 1	,,	37
එම 2. 3. එකක්	,,	12
මදනා ලංකාරය	,,	12

		රු. ශත.
මාධවය 1. 2. 3. කාණ්ඩයන්,		2 00
එම 4	,,	1. 00
මුරකාලාංගි නිඝණ්ඩින්නාව	,,	50
යෝග ශතකය	,,	25
යෝගමුක්තාහාරය	,,	62
යෝගදර්පණය	,,	31
යෝග සත්සාරය	,,	50
යෝග මංජරිය	,,	18
යෝගාලංකාරය 2 වෙනි	,,	12
යෝගරත්නාකරයහමෙන්බැද	,,	3. 50
එම සන්නස පලමුවෙනි	,,	1. 00
යෝග මාලාව	,,	12
රස වෙද පොත	,,	12
රසසද රත්නාවලිය	,,	1. 00
රහස්ඖෂධ මංජුසාව	,,	12
එම චින්තාමණිය	,,	12
වටිකාප්‍රකරණය කාණ්ඩදෙක	,,	3.00
වර්ණවෙදපොත 1, 2. කාණ්ඩයන්		10
වරයෝග සිතුමිණ	,,	50
වරල වර්තිකාව	,,	12
වාග්භටය	,,	62
වෙදහටන	,,	12
වෛද්‍ය ජීවනිය	,,	62
වෛද්‍යාභිධානය	,,	1.00
වෛද්‍යා මෘතය	,,	50
වෛද්‍යා ලංකාරය	,,	25
වෛද්‍යනත ජ්‍යොතිෂ අකාරාදිය	,,	50
සජීවන විනොදනිය	,,	20
සර්වවෙද නිඝණ්ඩුව කාන්ඩ 4 එකක්		12
සර්වවෙද පොත	,,	50
සරස්වති නිඝණ්ඩුව	,,	62
සන්නාෞෂධ සංග්‍රහව	,,	12
සාරසංක්ෂේපය 1.2 3 4. කාණ්ඩයන්		1.00
සාර්වසංග්‍රහව	,,	50
සාගරෞෂධ අඩ්දීපනිය	,,	18
සාරසමුච්චය	,,	20
සිරිමල් නිඝණ්ඩුව	,,	25
සුශ්‍රුත නිදානස්ථානය	,,	1.00
එම සූත්‍රස්ථානය	,,	75
සෙත්හාමිඩිය	,,	37
සෙහෝම ශතකය	,,	31

ඉහත දක්වන ලද පොත් සහ දැනට සිංහල අකුරෙන් මුද්‍රණය කර නිකුත්කර තිබෙන සියළු පොත් වලින් කොළඹ දෙවෙනි මරදානේ නොම්බර 142 පොත් සාප්පුවේ ඇම්. ඇම්. පී. විජයරත්න මහා මහතාගෙන් ලබාගන්ට පුළුවන.

M. M. P. Wijayaratna.